තුම්පත් රටා - 3

# සිංහල සිරිත් විරිත්

(c) Sumitha Publishers

**ජේ. බී. දිසානායක**
කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අංශයේ සම්මානිත මහාචාර්ය

# පටුන


පෙර වදන

1. වැහැපං දෙයියෝ
කස පැං දෙඤ්ඤැයි 1

2. අවුරුද්දත් කිට්ටු කිට්ටු
එරමුදු මල් පොට්ටු පොට්ටු 8

3. අප්පුඩි පුප් පුවත්ත
කැවුං දෙකක් දියත්තා 25

4. රජ්ජුරුවෝ උඩයි උඩයි
මිටි කොල්ලෝ බිමයි බිමයි 44

5. දුං දුමටයි අඟුරු මටයි
මේ යන දුං කෝට්ටෙටයි 56

6. උතුම් තෙරුවන් බෙලෙන් වේවා
යුවතිපති හට මංගලම් 68

7. තනේ මවුන්ගේ කිරි සමඟ එක් කොට
කනේ වක්කරං තද බඩ රුදාවට 80

8. තණ්ඩලේ දෙන්නා දෙපොළේ දක්කනවා 95

සූචිය 106


(c) Sumitha Publishers

# පෙර වදන

'තුම්පත් රටා' යන නමින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ තුන් අවුරුද්දකුත් තුන් මසක් ප්‍රචාරය වුණු වැඩ සටහන් අතුරින් තවත් අටක් මේ පොතින් ඉදිරිපත් කෙරේ. මීට කලින් මෙබඳු වැඩ සටහන් සමහරක් මුල් කොට ගෙන **'සිංහල වෙහෙර විහාර'** හා **'සිංහල බුදු සමය'** යන නමින් පොත් දෙකක් පළ කරන ලදි. මේ පළ වන්නේ මේ පොත් පෙළේ තුන්වැන්නයි.

'සිංහල වෙහෙර විහාර' නම් පොත මුලින්ම පළ වුණේ 1988 දීය. එහි දෙවෙනි මුද්‍රණය 1996 දී පළ විණ. එස්. ගොඩගේ මහතාගේ ප්‍රකාශනයක් වශයෙනි. 'සිංහල බුදු සමය' නම් පොත පළ වුණේ 1991 දීය. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ ප්‍රකාශනයක් වශයෙනි. 'සිංහල සිරිත් විරිත්' යනුවෙන් මේ ලිපි සංග්‍රහය නම් කෙළෙමි.

(c) Sumitha Publishers

'තුම්පත් රටා' නම් වැඩ සටහන මුළුමනින්ම සිංහල සංස්කෘතිය අරබයා වෙන් වූවකි. සිංහල සංස්කෘතියෙහි විවිධ පැතිකඩ පොදු රසිකයාට හඳුන්වා දීම මේ වැඩ සටහන්වල අරමුණ විය. 'සිංහල වෙහෙර විහාර' නම් පොතින් ඉදිරිපත් කෙරුණේ අපේ රටේ රජ මහ විහාර හයක් පිළිබඳ තොරතුරුයි. 'සිංහල බුදු සමය' නම් පොතට එක් වුණේ සිංහල බුදු සසුන පිළිබඳ තොරතුරුයි.

මේ පොතට එක් කොට ඇත්තේ සිංහල සිරිත් විරිත් හා සම්බන්ධ වැඩ සටහන් අටකින් ඉදිරිපත් කෙරුණු තොරතුරුයි. 'සිරිත් විරිත්' යන පද දෙක චාරිත්‍ර හා වාරිත්‍ර යන පද දෙක හා බැඳෙයි. යම් කිසි සාරධර්මයක් රැකීමට හෝ වෙනත් අරමුණක් ඉටු කර ගැනීමට හෝ සිතාමතාම කර ගෙන එන දේවල් 'සිරිත්' හෙවත් 'චාරිත්‍ර' ද සිතාමතාම නොකරන දේවල් 'විරිත්' හෙවත් 'වාරිත්‍ර' ද වෙයි.

සිංහල අලුත් අවුරුදු කාලයෙහිදී සිංහලයන් කරන දේවල් මෙන්ම නොකරන දේවල්ද රාශියක් ඇත්තේය. අලුත් අවුරුදු උදාවෙන් පසු ළිඳෙන් පළමු වන වතුර බාල්දිය ලබා ගන්නට පෙර ඊට **යම් යම් වස්තු** දැමීම **සිරිතකි.** නොනගතය නම් කාල පරිච්ඡේදය තුළදී **ළිඳෙන් වතුර නොගැනීම විරිතකි. සිරිත්** ඇසට පෙනේ; කනට ඇසේ. **විරිත්** ඇසට නොපෙනේ; කනට නෑසේ.

මෙහි එන පරිච්ඡේද නම් කොට ඇත්තේ ඒ ඒ පරිච්ඡේදවලම ඇතුළත් වන ජන කියමන් අනුසාරයෙනි. ඒ ඒ පරිච්ඡේදවලින් ඉදිරිපත් කෙරෙන්නේ කෙබඳු තොරතුරුද යන්න පිළිබඳ ඉඟියක් මේ කියමන්වලින් ලැබේ.

නියං සමයට වැසි පල ලබා ගැනීමට සිංහලයන් කියන කරන දේ '**වැහැපං දෙය්යෝ කසපැං දෙඤ්ඤඤයි**' යන පරිච්ඡේදයෙහි දැක්වෙයි. එහෙත් මෙහි ඇතුළත් වන්නේ වැසි නැති විට වැසි ලබා ගැනීමට කරන දේ පමණක් නොවේ. වැසි ඇති වූ විට වප් සමාදන් වීම ආදී බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර ආදිය ගැනද තොරතුරු මෙහි අඩංගු වෙයි.

(c) Sumitha Publishers

සිංහල අලුත් අවුරුද්ද නිසා උපන් සිරිත් විරිත් '**අවුරුද්දත් කිට්ටු කිට්ටු එරමුදු මල් පොට්ටු පොට්ටු**' යන පරිච්ඡේදයෙහි එයි. පරණ අවුරුද්දේදී මෙන්ම අලුත් අවුරුද්දේදීත් කියන කරන දේවලට අමතරව 'නොනගතේ' නම් කාල පරිච්ඡේදයෙහිදී කරන නොකරන දේද මෙහි විස්තර වෙයි. 'නොනගතේ' යනු එක් අවුරුද්දකට වත් අයත් නැති කාල සීමාවක් නිසා එය සිතට බිය ගෙන දේ.

ළමා අවධියේදී සිංහල දරුවන් කියන කරන දේ '**අප්පුඩි පුඩි පුවත්තා කැවුං දෙකක් දියත්තා**' නම් පරිච්ඡේදයෙහි ඇතුළත් වෙයි. මව් තුරුලේ සිටින අවධියෙහි සිට සිංහල බසේ රිද්මය හඳුනා ගන්නා කුඩා දරුවන් වයසින් වැඩෙත්ම සිය බස් වහර රිද්මයානුකූලව යොදන සැටි මෙහි විස්තර වෙයි. සිංහල දරුවන්ගේ නිර්මාණ ශක්තිය එමඟින් හෙළි වෙයි.

සිංහල රජ්ජුරුවන් නිසා උපන් සිරිත් විරිත් '**රජ්ජුරුවෝ උඩයි උඩයි - මිටි කොල්ලෝ බිමයි බිමයි**' යන පරිච්ඡේදයෙහි

එක් වෙයි. රජෙක් යනු අසාමාන්‍ය මිනිසෙකි. මිනිසුන් අතර දෙවියෙකි. එබැවින් එබන්දෙකුගේ මහේශාක්‍යභාවය ආරක්ෂා කොට ගනු වස් කරන කියන දේවල් මේ පරිච්ඡේදයෙහි ඇතුළත් වෙයි. සිංහල ජනතාව 1815 වන තෙක් රජවරුන් විසින් පාලනය කරනු ලැබිණ.

පස්වන පරිච්ඡේදය පාරම්පරික සන්නිවේදන විධි විමසිල්ලට හසු කරයි. මේ පරිච්ඡේදය හැඳින්වීම සඳහා යොදා ගත් **'දුං දුමටයි අඟුරු මටයි - මේ යන දුං කෝට්ටෙටයි'** යන කියමන කුඩා දරුවන්ගේ ජන වහරේ එන්නකි. ඈත අතීතයෙහිදී සන්නිවේදනය සඳහා දුම් හෝ දුම් ගොබ යොදා ගත් ආකාරය ඉන් හෙළි වේ. මේ පාරම්පරික සන්නිවේදනය කාලයාගේ ඇවෑමෙන් වෙනස් විණ.

ජීවන ගමන් මගෙහි එන එක් සන්ධිස්ථානයක් විවාහයයි. තනිකඩ ව හුන් පිරිමියෙකුත් ගැහැනියකත් යුවති පති බවට පත් වන්නේ මේ විවාහ මංගල්‍යයෙහිදීය. මෙය එක්තරා සංක්‍රාන්ති අවස්ථාවක් නිසා එහිදී මනමාලයාත් මනමාලියත් ආරක්ෂා කර ගැනීම අවශ්‍ය වෙයි. මේ මංගල්‍යයෙහිදී පැවැත්වෙන බොහෝ සිරිත් විරිත් මේ අරමුණින් ඇති වුණු ඒවා බව පෙනේ. **'උතුම් තෙරුවන් බෙලෙන් වේවා - යුවතිපති හට මංගලම්'** නම් පරිච්ඡේදය විවාහ සිරිත් විරිත් පිළිබඳවය.

(c) Sumitha Publishers

බඩ රුදාවක් හැදුණු කල්හි ඊට පිළියම් වශයෙන් **කනට** බේත් වක් කරයි නම් එහි කිසියම් ගුප්ත බවක් ඇත. එය වෙදකමකට වඩා කෙමකට නැකම් කියයි. 'කෙම්' යනු කෙබඳු පිළියම් වෙසෙසක්දැයි පැහැදිලි කිරීම **'තනේ මවුන්ගේ කිරි සමඟ එක් කොට - කනේ වක්කරං තද බඩ රුදාවට'** නම් පරිච්ඡේදයෙහි අරමුණයි. කෙම්වලට ආවේණික පොදු ලක්ෂණ හෙළි කරන අතරම ඇතැම් රෝග සඳහා නිතර යෙදෙන කෙම් සමහරක්ද මෙහි දැක්වේ.

මෙහි අවසාන පරිච්ඡේදය වෙන් වූයේ පැරණි කාලයෙහි සිදු වුණු ගමන් බිමන් පිළිබඳ තොරතුරු හෙළි කරනු පිණිසයි. එදා ගිය ගමන් වර්ග ගැන මෙන්ම ඒ සඳහා යොදා ගත් යාන

වාහන ගැනද තොරතුරු මෙහි ඉදිරිපත් කෙරේ. දුර බැහැර පළාත්වලට ගිය කරත්තකරුවන් ගවයන්ගේ හිත සුව පිණිස කළ කී දේ මෙහි විශේෂයෙන් සඳහන් වේ. එක් හරකෙකු අදින බර බෙදා ගැනීම පිණිස **'තණ්ඩලේ දෙන්නා දෙපොළේ දැක්කීම'** මහත් උපකාරයකි.

'තම්පත් රටා' වැඩ සටහන් මාලාව ඒ අවුරුදු තුනෙහිම ජනප්‍රියතම වැඩ සටහන වශයෙන් ශ්‍රාවකයන් තෝරා තිබුණු බව ගුවන් විදුලි සංස්ථාවේ පර්යේෂණ අංශය එහි වාර්ෂික වාර්තාවල සඳහන් කොට තිබේ. පොදු ජනතාව ඒ වන විට වැඩියෙන්ම සවන් දෙමින් සිටියේ ධර්මදේශනාවට ය. 'තුන්පත් රටා' වැඩ සටහනින් ධර්මදේශනයේ අරමුණද ඉටු වුණු නියාවකි.

මේ වැඩ සටහන්, පොත් වශයෙන් මුද්‍රණය කොට පාසැල්වලට බෙදා දීමට කටයුතු කරන බව එදා ප්‍රවෘත්ති අමාත්‍යවරයා ව සිටි ආනන්ද තිස්ස ද අල්විස් මහතා රාජ්‍ය සභා මන්ත්‍රණ සභාවෙහිදී කී බව 1980 ඔක්තෝබර් 27 වන දින හැන්සාඩ් නිල වාර්තාවේ 1826 පිටුවේ සඳහන් වේ. එහෙත් එවැන්නක් සිදු නුවූයෙන් ඒ සමහර වැඩ සටහන් මෙසේ මා විසින්ම පොත් බවට හරවන ලදි.

(c) Sumitha Publishers

මේ පොත මුද්‍රණය කරන්නට භාර ගැනීමෙන් දේශබන්ධු සිරිසුමන ගොඩගේ මහතා මට දැක්වූ අනුග්‍රහය බෙහෙවින් අගය කරමි. මෙහි කවරය සැලසුම් කරන ලද්දේ සමන් සිරිවර්ධන මහතා විසිනි. මෙහි 'පද' බෙදීමේ' දී 'ද', 'ම', 'ය', 'යි' වැනි තනි කළුඅකුරින් පද වෙන් නොකෙරිණ. මෙහි තද කළු අකුරින් ලියා ඇති පදවල 'සූචියක්' පොතේ අගට එකත් කොට ඇත. මේ පොත කියවා අගනා උපදෙස් දුන් කුසුම්ටද මගේ කෘතඥතාවත් සෙනෙහසත් හිමි වේ.

**ජේ. බී. දිසානායක**

2004 වැන්නේ සැප්තැම්බර් මස පළමු වනදා
නුගේගොඩ පීටර්ස් පෙදෙසේ අංක 2ඒ නිවසෙහිදී.

1

# වැහැපං දෙයියෝ
# කස පැං දෙක්කදයි

වැස්ස මිනිස් ජීවිතය කෙරේ එදත් බල පෑ, අදත් හෙටත් බලපාන දහමකි. ගස් කොළං නියංචකුටු වී, පොළොව පැලිවලං පැලී, කුඹුරු ඉරි තලා ගෙන යන නියං කාලයට වැස්සේ අගය කාටත් දැනේ. සිංහල ගැමියෝ එදාට වලාකුළින් තොර නිල් අහස දෙස බලා ගෙන මෙසේ කියති:

අහසට කවුද අණවින කරපු දෙවියෝ
පොළොවට දැමූ බෝගේ දනවා දෙවියෝ
යායක රුව බලා වැඩ කරනා දෙවියෝ
අද හෙට පමණ වැස්සක් වැහැපං දෙවියෝ

*(පහළ උඩවේ ජනකවි, ස. ජ. සුමනසේකර බණ්ඩා 21 පිට)*

එක් වරම අහස කළු කර ගෙන එයි. වැහි ලේන්නු අහස පුරා ඉගිලෙති. හිටි හැටියේම මහා වැස්සක් කඩා වැටෙන්නේ

"හැම දා නියං එකදා වැහි වලාවේ"

යන ජන කවිය මතක් කර දෙමිනි.

වැස්ස ඇති වන්නේ කෙසේදැයි අද අපි දනිමු. එහෙත් ආදිම මිනිස්සු එය නොදත්හ. තමන්ට තේරුම් ගත නොහැකි බොහෝ දේවල් සිදු වන්නේ 'දෙවියන්' නිසා යැයි ඔවුහු ඇදහූහ. දෙවියෝ තමන් කැමති විටක වැසි වැස්සූහ. තමන් කැමති විටක

(c) Sumitha Publishers

වැසි නවත්වා නියඟ ඇති කළහ. වැස්ස දෙවියන්ගේ කැමැත්තෙන් සිදු වන්නක් නම්, දෙවියන් සතුටු වූ විට වැසි වැටෙයි; අසතුටු වූ විට හෝ කෝප වූ විට වැසි නොවැටෙයි.

**''වැහැපං දෙය්යෝ - කසපැං දෙඤ්ඤයි''**

යනුවෙන් ගැමි කවියෙකු දෙවියන්ට කන්නලව් කළේ ඔවුන් සතුටු වන පරිදි ''කසපැං'' හෙවත් කුරුම්බාවක පැන් ද ඔවුන්ට පඬුරු කොට පුදන බවට ඇප වීමෙනි.

වැස්ස දෙවියන්ගේ කාරියක් නම් ඔවුන්ගේ සිත් රිදෙන පරිදි වැස්ස ගැන කතා කිරීමටත් ගැමියෝ බිය වූහ. මුහුදු යන සිංහලයෝ වැහි කෝඩයක් එන විට අද පවා ''වැස්ස වහිනවා'' යයි නොකියති. ඒ වෙනුවට ''ගඟුල කරුණා කරනවා'' යයි කියති. ''කරුණා කරනවා'' යන යෙදුම, ගැමියන්ගේ ශ්‍රද්ධා භක්තිය හා මුසු වූවක් බව සිරිපා වන්දනාකරුවෝද දනිති.

(c) Sumitha Publishers

වැස්ස දෙවියන්ගේ කාර්යයක් පමණක් නොව දෙවියෙකුම යයිද සමහරු සිතූහ. වැස්ස හැටියට මහ පොළොවට එන්නේ මේ දෙවියන් යයි ඔවුහු ඇදහූහ. මේ දෙවියන්ට **''වස්ස වලාහක දෙවියෝ'' ''වරුණ දෙවියෝ'' ''මේඝවර්ණ දෙවියෝ''** වැනි නම් යෙදිණි.

දෙවියන් සතුටු කොට වැස්ස වස්සවා ගැනීමේ අරමුණින් බිහි වුණු නොයෙක් පූජා විධි සිංහල ජන සංස්කෘතියෙහිද හමු වෙයි. මින් එකක් **''පැං පෙරහැර''** යි. රජරට ගැමියෝ අදත් නියං කාලයට පවත්වන මේ පෙරහැරේ අරමුණ වැසි පල ලබා ගැනීමයි. කිසියම් පෝය දිනක, ගැමියෝ එකතු වී **තිසා** වැවට යති. එතැනින් මැටි බඳුන්වලට පැන් පුරවා ගෙන, හේවිසි සහිත පෙරහැරින්, උඩමළුවට එති. **''උඩමළුව''** යන්නෙන් රජරට ගැමියන් අදහස් කරන්නේ උඩමළුවේ පිහිටි ජය ශ්‍රී මහා බෝධි වෘක්ෂයයි. එහිදී ''ජය සිරිමා බෝ හාමුදුරුවන්'' පැනින් නහවා වැස්ස ලබා දෙන ලෙස අයදිති. බෝධිය නැහැවීමේ සිරිත මුලින්ම ඇති වූයේ වැස්ස ලබා ගැනීමේ අරමුණින් යයි සිතිය හැකිය.